13

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන
පස්වන මට්ටම - 2021/2022
අවසාන පරීක්ෂණය 2022
**STU5314** - අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.12.03 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

I වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## <u>I වන කොටස</u>

01. වර්තමාන ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියෙන් බැහැරව ක්‍රියාත්මක වන මාර්ගෝපදේශ හා උපදේශන සේවාවක් නම් කර ඔවුන් විසින් සපයනු ලබන සේවා දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

02. උපදේශනයේ ප්‍රධාන ආචාර ධර්ම තුනක් (03) ලැයිස්තුගත කර ඉන් එකක (01) වැදගත්කම පැහැදිලි කරන්න.

03. උපදේශනයෙහි එන මනෝවිශ්ලේෂණාත්මක ප්‍රතිකාරයෙහි ප්‍රධාන අරමුණු දෙක (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

04. පාසල විසින් වැඩ ලෝකයට සාර්ථක ලෙස පිවිසීම සඳහා ශිෂ්‍යයින්ට ප්‍රගුණ කිරීමට අවස්ථා සලසා දිය යුතු ප්‍රධාන කුසලතා පහක් (05) ලැයිස්තු ගත කරන්න.

05. ද්විතියික පාසල් ළමුන් හට උපදේශන සේවා අවශ්‍ය විය හැකි වීමට හේතු දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ළමුන් තුළ හැසිරීම් ගැටළු ඇති වීමට බලපෑ හැකි පාසල් පරිසරය හා සම්බන්ධ සාධක පහක් (05) සඳහන් කරන්න.

07. මන්ද මානසික ළමුන්ට සහාය වීම සඳහා ගුරුවරයෙකු හට භාවිත කළ හැකි උපායමාර්ග දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

08. ඉගෙනුම් නො හැකියාවලින් යුත් ළමුන්ගේ සුවිශේෂී ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## II වන කොටස

09\. i. උපදේශනය යන සංකල්පය ඔබගේ වචනයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii. වර්තමාන ශ්‍රී ලාංකික සන්දර්භය තුළ සුරාපාන හා මත්ද්‍රව්‍ය උපදේශනයෙහි ඇති වැදගත්කම හේතු දෙකක් (02) දක්වමින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iii. "කොවිඩ් -19 ලෝක ව්‍යාප්ත වසංගත තත්ත්වය ශිෂ්‍යයින් සඳහා මාර්ගෝපදේශය හා උපදේශනය ලබා දීමෙහි අවශ්‍යතාවයක් නිර්මාණය කළේය."

හේතු හතරක් (04) දක්වමින් මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න.
(ලකුණු 03 x04 =12)

10\. i. පාසල් සන්දර්භයෙන් උදාහරණයක් ගෙනහැර දක්වමින් සමායෝගය යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii. සමායෝගී වීමට අපොහොසත් වීම ඉගෙනීම පිළිබඳ ගැටළුවලට මඟ පාදන්නේ කෙසේ ද? සුදුසු උදාහරණයක් සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. සුවිශේෂී උපායමාර්ග හතරක් (04) අවධාරණය කරමින් ගුරුවරයෙකු විසින් ශිෂ්‍යයින් තුළ මනා ලෙස සමායෝගී පෞරුෂයක් සංවර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සැපයිය හැක්කේ කෙසේ දැයි විස්තර කරන්න. (ලකුණු 12)

11\. "වර්තමාන පාසල් පද්ධතිය තුළ වැඩෙන්නා වූ සංකීර්ණතා පාසල් මාර්ගෝපදේශය හා උපදේශනය සඳහා දැඩි අවශ්‍යතාවයක් ඇති කර තිබේ."

i. ප්‍රාථමික පාසල් ළමුන් හට මාර්ගෝපදේශය හා උපදේශනය සැපයීම සඳහා අවශ්‍යතාවයක් නිර්මාණය කර ඇති පාසල් පද්ධතිය හා සම්බන්ධ සාධක තුනක් (03) සඳහන් කරන්න. ( 1 x 3 =ලකුණු 03)

ii. සුදුසු උදාහරණයක් දක්වමින් පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාවක් අඛණ්ඩ විය යුත්තේ මන් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාවන්හි සංවිධාන ආකාර තුන (03) නම් කර ඔබගේ පාසල/ඔබගේ ගමෙහි පිහිටි පාසල සඳහා වඩාත් ම සුදුසු සංවිධාන ආකාරය හේතු තුනක් (03) දක්වමින් සාධාරණීකරණය කරන්න. (ලකුණු 12)

12. "පාසල් පද්ධතිය තුළ භාවිතා කරනු ලබන උපදේශන ශිල්ප ක්‍රම පරීක්ෂණ හා පරීක්ෂණ නො වන ශිල්ප ක්‍රම ලෙස කොටස් දෙකකට බෙදා දැක්විය හැක."

i. ගැටළුවකට මුහුණ දී සිටින ශිෂ්‍යයකු පිළිබඳ ව දත්ත රැස් කිරීම සඳහා ගුරුවරයෙකු හට එක් උපදේශන ශිල්ප ක්‍රමයක් මත පමණක් පදනම් විය නො හැක්කේ මන් දැයි හේතු තුනක් **(03)** ඔස්සේ සඳහන් කරන්න.

(ලකුණු 01 x 03 = 03)

ii. පාසල් ප්‍රජාව හට මාර්ගෝපදේශය හා උපදේශනය ලබා දීමෙහි දී උපදේශන ශිල්ප ක්‍රමයක් ලෙස නිරීක්ෂණය භාවිතා කිරීමෙහි ඇති ප්‍රයෝජන කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iii. නිරීක්ෂණය මගින් රැස් කර ගන්නා ලද තොරතුරු වාර්තා කළ හැකි ක්‍රම දෙක **(02)** එම එක් එක් ක්‍රමය සඳහා උදාහරණය බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 06 x 02 = 12)

13. i. වෘත්තීය මාර්ගෝපදේශය හා උපදේශනයෙහි අරමුණු තුනක් **(03)** සඳහන් කරන්න.

(ලකුණු 01 x 03 = 03)

ii. එලි ගින්ස්බර්ග්ගේ වෘත්තීය තේරීම් පිළිබඳ න්‍යාය සඳහා පාදක වන මූලධර්ම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

iii. ගින්ස්බර්ග්ගේ න්‍යායෙහි එන ප්‍රධාන වෘත්තීය තේරීම් අවධි තුන **(03)** නම් කර එම එක් එක් අවධිය තුළ ඔබ ඔබගේ ශිෂ්‍යයින් වැඩ ලෝකය සඳහා සූදානම් කරවීමට අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කරන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 x 03 =12)

\- හිමිකම් ඇවිරිණි. -